## අඹන්ගග කෝරලේ ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 05 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 25 උනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ජුලි 18 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව අඹන්ගග කෝරලේ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට අඹන්ගග කෝරලේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 04 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු. 7,753,994 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 8,337,416 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,000,924 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 259,626 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2008 වර්ෂයට පෙර සිට පැවත එන රු. 82,818 ක කල් ඉකුත් තැන්පතු ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 නියමය අනුව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වාර්ෂික අයවැය ලේඛනයේ සඳහන් වැය විෂයයන් 67 කට අදාළව රු. 1,384,010 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් නොදරා වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම හෝ ඉතිරි කිරීම් කර තිබුණෙන් අයවැය ලේඛණය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| | | 000 | 000 | 000 |
| (i). | වරිපනම් හා බදු | 35 | 17 | 45 |
| (ii). | බදු කුලී | 500 | 146 | 6 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 280 | 148 | 1 |
| (iv). | වෙනත් ආදායම් | 10,434 | 9,271 | 1,670 |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 468,534 |
| (ii). | මුද්දර ගාස්තු | 806,080 |

### 2.3.3 කඩකාමර බදු

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2008 වර්ෂයේදී රු. 2,640,303 ක් වැය කර කඩකාමර 04 ක් ඉදිකර තිබුණි. එක් කඩකාමරයක් රුපියල් ලක්ෂ 03 ක බද්දකට තක්සේරු කර තිබු අතර, එකවර රුපියල් එක් ලක්ෂයක මුදලක් ලබා ගැනීමටත්, ඉතිරිය කාර්තුවකට රු. 16,750 ක් බැගින් වූ සමාන වාරික 12 කින් අයකර ගැනීමටත් සභාව තිරණය කර තිබුණි. විවෘත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව සභා අනුමැතිය මත කඩකාමර 02 ක් පමණක් බදු දී තිබු අතර, 2011 දෙසැම්බර් 31 දින වන විට කඩකාමර 03 ක් වසාදමා තිබුණි.

## 2.4 නිෂ්ක්‍රිය සම්පත්

වටිනාකම රු. 1,141,260 ක් වූ භෞතික සම්පත් නිෂ්ක්‍රියව පැවති බව විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

2.5 අවිධිමත් ගණුදෙනු

---------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ අංක 19(i) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව පළාත් පාලන කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සේවකයින් 07 දෙනෙකු බඳවා ගෙන 2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළව රු. 664,916 ක වැටුප්, සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති මාලාවේ 177 රීතිය ප්‍රකාරව රු. 5,000 හෝ එය ඉක්මවන කවර වැඩක් හෝ සේවාවක් ක්‍රියාත්මක කිරීම සඳහා රීති 207 හා 208 ප්‍රකාරව නියම කර ඇති ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කළයුතු වුවත්, අත්මිල ගණන් මත අවස්ථා 02 කදී රු. 120,965 ක මිලදී ගැනීම් කර තිබුණි.

(ඇ) මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2006 පෙබරවාරි 21 දිනැති අංක සිපිසි/සිඑල්ජ්/1/6 චක්‍රලේඛයට අනුව, සභාපතිට බල ප්‍රදේශයෙන් පිට කෙරෙන රාජකාරි ගමන් සඳහා සංයුක්ත දීමනාව ගෙවීමේදී චක්‍රලේඛයේ දැක්වෙන අවශ්‍යතාවයන් සම්පූර්ණ විය යුතු වුවත්, එකී විධිවිධාන වලට පටහැනිව සභාපතිවරයාට අවස්ථා 05 කදී රු. 24,200 ක සංයුක්ත දීමනා ගෙවීම් කර තිබුණි.

(ඈ) ඉන්ධන බිල්පත් පියවීම සඳහා වූ ගෙවීම් වවුචර් වලට අමුණා තිබූ ඉන්ධන පිරවුම්හල් වලින් ලබාගෙන තිබූ බිල්පත් වල රු. 117,934 වටිනාකමැති බිල්පත් 34 ක වාහනයේ අංකය යොදා නොතිබුණ.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සභාවේ හිටපු වැඩ බලන ලේකම්වරයා ගබඩා භාරව කටයුතු කළ අතර, 2011 සැප්තැම්බර් 07 දින ගබඩා භාණ්ඩ නව ගබඩා භාරකරු වෙත භාර දී තිබුණි. හිටපු ගබඩා භාරකරු විසින් ගබඩා භාණ්ඩ මිලදී ගැනීම හා නිකුත් කිරීම් සටහන් කිරීම සඳහා ගබඩා ලේඛන නඩත්තු කර නොතිබූ බැවින් තථ්‍ය ශේෂ පදනම් කරගෙන භාණ්ඩ භාරදී තිබුණි. ගබඩා ලේඛන නඩත්තු නොකිරීම සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් ද අවධානයට යොමුකර තිබුණ ද, කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.